# විනාඩියක් තුල™

## සාක්ෂි දැරිම

පහසු ඇදහිල්ල බෙදාගැනිම

# දෙවියන් වහන්සේ ඔබෙන් විනාඩියක්දී නපතා දෙන්න පුලුවන්ද ඇහුවොත් , ඔබ දෙනවාද?

යමෙකු තම ඇදහිල්ල ඔබ සමඟ බෙදා  ගැනීම ගැන ඔබ සතුටු වන්නේ නැද්ද? යේසුස් වහන්සේ නම් පිලිතුර , මේ බිඳුණු ලෝකයේ අන් අය සමඟ උන්වහන්සේගේ විසඳුම ක්‍රියාශීලීව අප බෙදා  හදා  ගත යුතු නොවේද?

“මම, මගේ ඇදහිල්ල බෙදා ගන්න”

ඔව් , අපි උන්වහන්සේගේ තානාපතිවරුන් , උන්වහන්සේගේ හඩ , උන්වහන්සේගේ හදවතේ ස්පන්දනය විමට තෝරා ගෙන ඇත. ඇයි?  මක්නිසාදයත් ජීවිතය වෙනස් කරන දෙවියන්වහන්සේගේ ආදරයට ඔබ සහ මම තරම් හොඳ ප්‍රචාරණයක් නොමැත! උන්වහන්සේගේ මහිමේ කුසලාන අපි වෙමු.

“සුභාරංචි සේවය අමාරුයි” හෝ  “එය පාලකතුමා ගේ කායර්යි” ඔබට සිතෙන්නට පුලුවන්. නැතිනම් යම් කෙනෙක් ඔබෙන් අමාරු ප්‍රශ්නයක් අසයි කියා සිතන්නට පුලුවන.

මේ සිතුවිලි සහ බය අලුත් දේවල් නොවේ. දෙවියන් වහන්සේ සෑම කිතුණුවෙක්ටම තමන්ගේ ඇදහිල්ලේ කථාව කිමට ආරාධනා කරයි. ඇදහිල්ලේ කථාව අසන කෙනාට පමණක් නොව එය නැවත පෙරලා අපට ආශිර්වාද කරයි.

අනාරක්ෂිත හඩවල් වසා දැමිමටත්, දෙවියන් වහන්සේගේ හඩ අසන පිණිස ‘ආත්මික කන් ‘ දෙන පිණිස ඉල්ලා සිටිමු!

අපි හැමෝටම මෙය කල හැකිය. අපි හැමෝටම කථාවක් ඇත, සහ මිනිත්තුවකදි සාක්ෂි දැරිම විනෝදජනකයි සහ ලෙහෙසි. මේ මිනිත්තුවකදි සාක්ෂි දැරිමේ මෙවලම ඉගෙන ගෙන සහ පාවිච්චි කල පසු එක් පාලකවරෙයක් මෙසේ සදහන් කලා,

“මගේ සාක්ෂිය බෙදා නොගැනිම නිසා අවුරුදු ගණනාවක් මට නාස්ති වුණා. දැන් මට ආත්ම විශ්වාසයෙන් දිනපතා මෙය කල හැකිය.”

... සහ එය ඔබටත් පුලුවන්ය!

ටොම් ඉලයි

# ශුද්ධාත්මයාණන්ව හන්සේට ආරාධනා කරමු

ඔබගේ ජීවිතය වෙනස් කල යේසුස් වහන්සේ ගැන කිමට මිනිත්තුවකදි සාක්ෂි දැරිම ඔබට උපකාර කරන සරල උපකාරයකි. එය මෙවලමකි. එය පණිවිඩය නොවේ. අපි ශුද්ධාත්මයාණන් වහන්සේගේ විශ්වාසයට හා මග පෙන්විමට යටත් විය යුතු අතර “සියලු මනුෂ්‍යයින් මා වෙතට කැදවිමේ හැකියාව” උන්වහන්සේ තුල පවති (යොහාන් 12:32).

යේසුස් වහන්සේ නිතරම නාදුනන අය වෙතට ලංවුණා... ලිද ලග සිටිය ස්ත්‍රිය, ගස උඩ සිටි සාකෙවුස් සහ මතෙව් නම් බදු අයකරන්නා වේ. අනෙක් හැම අවස්ථාවකදිම යේසුස් වහන්සේ සම්බන්ධතාවයන් ගොඩනගන්නට කාලය ගත් අතර දේව හඩට කීකරු වෙන්න නිතරම ඉක්මන් වුණා. අනුකම්පාව නිතරම උන්වහන්සේට බල කලා!

ඔබගේ ඇදහිල්ල කවදාද, කොහේද සහ කාත් සමග බෙදා ගන්නේද? සෑම දිනකම පහත යාච්ඤාවෙන් ආරම්භ කරන්න.

“ස්වාමිනි මම සුදානම්!”

# විනාඩියක්

## තුලදී සාක්ෂි දැරීමේ මෙවලම


පිටුව

1. අවසරය
මම ඔබෙන් ප්‍රශ්නයක් අසන්නද? 6

2. ක්‍රි.ව (ක්‍රිස්තුස් වහන්සේට පෙර)
මගේ ජීවිතයේ කාලයක් තිබුණා... 8

3. හැ.ල. (හැරවුම් ලක්ෂය)
එනම් එක් දිනකදී...
යේසුස් වහන්සේ මගේ පව් උදෙසා මැරුණු බවට මම අවබෝධ කරගත් මොහොතේදී 10

4. තීරණයෙන් පසු (තී.ප)
මම යේසුස් වහන්සේව මුණගැසුනු දා සිට, මම... 12

5. යේසුස් වහන්සේව මම මුණනොගැසුණා නම්, මම... 14

# අවසරය

දෙවියන් වහන්සේ මනුෂ්‍යයන්ට ප්‍රේම කරන නිසා, ඔවුන් ආගන්තුකයන් වුවත් මිතුරන් වුවත් යේසුස් වහන්සේ ගැන අපි ඔවුන්ට කියන්න ඕනේ. මෙන්න ආරම්භ කල හැකි ආකාරයක්:

## අවසරය

අපගේ සිතුවිලි බෙදා ගැනීමට අපි ' අවසර ' ඉල්ලූ විට, අපි ඔවුන්ට ගෞරවයෙන් සලකයි. මෙන්න ඔබගේ කථාව වෙනස් කල හැකි ක්‍රම කිහිපයක්...

## විනාඩියක් තුල සාක්ෂි දැරීම

මෙම සරළ ක්‍රම 5 මතක තබාගැනීමට ඔබගේ ඇඟිලි පාවිච්චි කරන්න!

(ප්‍රශ්නයක් තෝරාගන්න නැත්නම් ඔබගේම ප්‍රශ්නයක් ලියන්න)

“මම මගේ ඇගයීමක් කරන ගමන් ඉන්නේ. මම ප්‍රශ්නයක් අසන්නද?”

“ඔබට සිදුවූ අනසර්තම දේ කුමක්ද?”

“මගේ ජීවිතේ සිදුවූ හොදම දේ කියන්නද?”

“අපේ ලෝකය බයෙන් පිරිලා තියෙන්නේ. මගේ බය නැතිකරගත්ත  විදිහ කියන්නද?”

“මම යන්න ඉස්සෙල්ලා මගේ කථාව අසන්න ඔබට මිනිත්තුවක් දෙන්න පුළුවන්ද?”

මෙම සරළ ක්‍රම 5 මතක තබාගැනීමට ඔබගේ ඇඟිලි පාවිච්චි කරන්න!

# ක්‍රිස්තුස් වහන්සේට පෙර

(ක්‍රි.පූ)

ඔබගේ ක්‍රි.ව පෙර කථාව ආරම්භ කිරීමට පිටු අංක 16 බලන්න

යේසුස් වහන්සේ හමුවීමට පෙර කථාවක් අපි හැමෝටම තියෙනවා.

මෙය අපේ 'ක්‍රි.පූ' මොහොතයි. ඔබගේ ජීවිතයේ හිස්කමෙන්, අස්ථිරභාවයෙන් සහ කැඩුනාවූ කාලයක් ගැන සිතන්න. එතනින් තමයි ඔබගේ කථාව ආරම්භවන්නේ.

යේසුස් වහන්සේ හමුවීමට පෙර ඔබගේ පාපි සහ කැඩුණාවූ පුරුදු විස්තර කරන්න.

ඔබගේ වාක්‍ය මෙලෙස ආරම්භ කරන්න:
"මගේ ජීවිතයේ එක්තරා අවධියක..."

සමහරවිට ඔබ තනියෙන්, උඩගුකමින් සහ බලාපොරොත්තු රහිතව සිට ඇත. සමහර විට ඔබ වැදගත්කමකින් තොරව, වරදකාරි හැගිමකින් හෝ කනස්සල්ලකින් තොරව සාර්ථක වි ඇත. සමහර විට ඔබ ජිවිතය ගැන බලාපොරොත්තු සුන්වි හෝ දෙවියන් වහන්සේ කෙරෙහි කෝපයෙන් හෝ මිය යාමට බිය විය හැකිය. මෙවැනි ලැයිස්තුන් ඉදිරියට යා හැක.

සමහර විට ඔබගේ තරුණ අවධියේදි ඔබ ජිවිතය යේසුස් වහන්සේට කැප කර ඇත. ඔබට නිශ්චිත දිනයක් මතක නැතුව ඇත. ඔබට සමාව අවශ්‍ය, වරකාරි හැගිම සහ දෙවිකෙනෙක් සිටිනවා කියන දේ පමණක් මතක ඇති.

ඔබේ ක්‍රි.ව ට පෙර ජිවිතය මතක ඇති විට ඔබේ කථාව ආරම්භ කිරිමට හැඩයක් ගන්නවා. පිටු අංක 16 ඇති මෙම වාක්‍යය අවසන් කරන්න

විශේෂ නාම පද තුනක් හෝ වාක්‍ය තුනක්
“මගේ ජිවිතයේ එක්තරා අවධියක...”



# හැරවුම් ලක්ෂ්‍යය (හැ.ල.)

"එනම් එක්දිනක්..."

සියළුම දේ වෙනස් කරන මොහොත මෙයයි. ඔබගේ හැරවුම් ලක්ෂ්‍යය වන්නේ යේසුස් වහන්සේ කවුද යන්න දැනගත් විට සහ උන්වහන්සේ තමන්ට කර ඇති දේවල් කරණකොටගෙනය.

සමහරක්විට යම් කෙනෙක් ඔබට සුභාරංචිය පවසා ඇත. ඔබගේ අමාරු අවස්ථාවේදී දෙවිඳුන්ට හඬගසා ඇත නැතිනම් ඔබට අත්හැරිය නොහැකි ආකාරයෙන් ඒ ප්‍රේමය අත්දැක ඇත.

## මෙන්න හැ.ල සදහා උදාහරණ:

"මට ගොඩාක් ලෙස ආදරය කරන දෙවිකෙනෙක් සිටින බවට කෙනෙක් මට දිනක් පැවසුවා". මේ දෙවියන් වහන්සේ පුද්ගලික සහ දුරින් සිටින කෙනෙක් නොවන අතර උන්වහන්සේ සමග ස්වගර්යේ සිටින්නට මා හට ආරාධනා කර තිබෙනවා. නමුත් මට ප්‍රශ්නයක් තිබුණා. ස්වගර්ය සම්පූණර් ස්ථානයක් වන අතර මම ඒසේ නොවේ සහ මට එයට ඇතුල්විමට නොහැකිය.

නමුත් දෙවියන් වහන්සේ මට මාගර්යක් සාදා ඇත. මගේ පව් වලට වන්දි ගෙවන්න දෙවියන් වහන්සේ තමන්ගේ පුත්‍රයාව ඒවනු ලැබුවා. යේසුස් වහන්සේ මා උදෙසා මිය ගිය බවත් නැවත නැගිටුන බවත් තේරුම් ගත් විට මම උන්වහන්සේට මගේ ජිවිතයේ නායකයා වෙන්න ආරාධනා කරනු ලැබුවා."

## ඔබගේ හැරවුම් ලක්ෂ්‍යය කුමක්ද?

ඔබ යේසුස් ගැන ඇසුවේ කෙසේද?

ඔබගේ යේසුස්ගෙන් ජිවිතයට ඉල්ලා සිටියේ කුමක්ද?

එය පිටු අංක 17 ලියන්න

විනාඩියක් තුල සාක්ෂි දැරීම

මෙම සරළ ක්‍රම 5 මතක තබාගැනීමට ඔබගේ ඇඟිලි පාවිච්චි කරන්න!

# තීරණයෙන් පසු

(ක්‍රි.ව)

ඔබගේ තීරණයට පසු කථාව සදහා පිටු අංක 18 බලන්න

## ක්‍රි.ව යනු 'තීරණයෙන් පසු'

මෙය අපේ කථාවේ පහසුම සහ විනෝදජනක කොටසයි. මන්ද, ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවිතේ තුල ඇති කර ඇති ධනාත්මක වෙනස ගැන කථා කිරීමට අපට හැකිවේ.

ඔබගේ සිතීමේ ක්‍රමය වෙනස් වූයේ කෙසේද? ඔබගේ පීඩනයන්, සම්බන්ධතාවයන් සහ පරමාථර්ය ඔබ හසුරුවන්නේ කෙසේද?

ඔබ අළුත් සමාදානය, අළුත් මිතුරන්,සමාව දීම හෝ ස්වගර්යේ පොරොන්දු අත්දැක ඇත!

ඔබට සැබෑ සහ අව්‍යාජ දේ කෙරෙහි අවධානය යොමු කරන්න. එය කෙටියෙන් හා පුද්ගලික කරන්න.

මෙම සරළ ක්‍රම 5 මතක තබාගැනීමට ඔබගේ ඇඟිලි පාවිච්චි කරන්න!

ඔබගේ වාක්‍ය මෙලෙස ආරම්භ කරන්න:
“මම ජේසුස් වහන්සේ මුණගැසුණු දා සිට, මම...”

ක්‍රි.ව.සඳහා උදාහරණයක් මෙන්න:
“යේසුස් වහන්සේට මගේ ජීවිතයේ රජු විමට ඉල්ලා සිටි බැවින් මට නව අරමුණක්, නව ප්‍රීතියක් සහ මා මිය ගිය විට මට ස්වගර්යට යා හැකි බවට විශ්වාසයක් ඇත”.

යේසුස් වහන්සේ ඔබගේ ජීවිතයට ලබා දි ඇති ධනාත්මක වරප්‍රසාද විස්තර කරන නාම විශේෂණ තුනක් සොයාගන්න.

මෙනෙහි කිරීමට මොහොතක් ගන්න.

පිළිතුරු ලියන්න සූදානම් වූ විට
පිටු අංක 18 ට පෙරලන්න

# මම ක්‍රිස්තුස් වහන්සේව මුණ ගැසී නොමැති නම්....

යේසුස් වහන්සේව නොදැන ඔබේ ජීවිතය කෙබදු වේදැයි සිතා බලන්න. එය බියජනක ලෙස පෙනේ, එසේ නොවේද? තීරණයෙන් පසු අවස්ථාවේ විස්තර කල ආකාරයට ඒ ආශිර්වාදයන් ඔබට නොලැබෙන්නේය.

ඔබේ ජීවිතයට යේසුස් වහන්සේ මුණගැසී නොමැති නම් ජීවිතය කෙසේ වී ඇද්ද?ඔබ කථා කරන විට අසන්නා ඔබගේ හදවතට ඇහුම් කන් දෙනවා. ඔවුන්ගේ ජීවිත හිස්, අර්ථයක් නොමැති බව හෝ තවමත් අරමුණ සොයා යන බව සමහරක් අය පවසයි. තවත් අය සිරගෙවල් වල, දික්කසාද වී හෝ මියගොස් ඇති බව කියයි.

ජීවිතය මුළුමනින්ම වෙනස් වනු ඇත.

ඔබ අවසන් වූ පසු අසා සිටි නිසා ස්තුති කරන්න.

සාමාන්‍යයෙන් පුද්ගලයෙක් යේසුස් වහන්සේට ජීවිතය භාර දෙන්න ප්‍රථම 7 වතාවක් ශුභාරංචිය අසන බවට මා අසා තිබේ. අපගේ ක්ෂණික ඉලක්කය ඔවුන්ව ඉක්මණින් යේසුස් වහන්සේ වෙතට දිනා ගැනිම නොව ඔවුන් තුල සාක්ෂියේ බීජය සිටුවීමයි. ඊට වඩා වැඩි දෙයක් සිදුවුවහොත් එය වරප්‍රසාදයකි!

ඔවුන් තවත් කථා කරන්නට විවෘතයි නම් ඔවුන්ගේ ප්‍රශ්න වලට ඔබට ප්‍රතිචාර දැක්විය හැක. දේවධර්මයන් ගැන සාකච්ඡා කරන්න යන්න එපා. ඔබගේ පණිවිඩයේ බලය නම් ඔබගේ හදවතින් කථාව බෙදාගැනිමයි. එය අන්ධ මිනිසා දුන් ප්‍රතිචාරය වගේය. එනම් “උන්වහන්සේ පව්කාරයෙක්ද නැද්දැයි මම නොදනිමි. එකක් දනිමි-මම අන්ධව සිටියෙමි, දැන් මට පෙනීම ඇත්තේයයි කීවේය.” (යොහාන් 9:25)

මෙම වාක්‍ය අවසන් කර පිලිතුර පිටු අංක 19 ලියන්න
මට යේසුස් වහන්සේ මු
ණගැසි නොතිබුණි නම්, මම...

# ක්‍රිස්තුස් වහන්සේට පෙර (ක්‍රි.ව පෙර)

## ක්‍රි.ව පෙර විශේෂණ නාම පද තුනකින් මෙම වාක්‍ය අවසන් කරන්න:

"මගේ ජීවිතයේ කාලයක් තිබුණා..."

1. ______________________

______________________

2. ______________________

______________________

3. ______________________

______________________

## ඔබගේ “හැරවුම් ලක්ෂය” කුමක්ද?

1. ඔබ යේසුස් වහන්සේ ගැන ඇසුවේ කෙසේද?
“එනම් එක්දිනක්...”

______________________________

______________________________

______________________________

2. වාක්‍ය අවසන් කරන්න:

“යේසුස් වහන්සේ මගේ පව් උදෙසා මියගොස් නැවත නැගිටුනු බව මා තේරුම් විට, මගේ ජීවිතයට උන්වහන්සේට ආරාධනා කලා...” ______________

______________________________

______________________________

# තීරණයෙන් පසු (තී.ප.)

## ක්‍රි.ව පසු. ඔබගේ ජීවිතයේ යේසුස් වහන්සේ කල ධනාත්මක වරප්‍රසාදයන් විස්තර කරන්න

"යේසුස් වහන්සේ මුණගැසුණු දින සිට, මා..."

1. ______________________________

______________________________

2. ______________________________

______________________________

3. ______________________________

______________________________

## ක්‍රිස්තුස් වහන්සේ නොමැතිව ඔබගේ ජීවිතය කොයි වගේද?

“මට යේසුස් වහන්සේ මුණගැසී නොමැත, මා…”

---

---

---

“අසා සිටියාට ස්තුතියි.
මේ එකමවූ යේසුස් වහන්සේ
ඔබට බොහෝ ලෙස ආදරෙයි!”

විනාඩියක්
තුල
සාක්ෂි දැරීම

# ඉදිරියට
# රැගෙන යමු...

විනාඩියක් තුල සාක්ෂි දැරූ පසු, පහත ප්‍රශ්න ඇසිය හැක:

1. “ඉතින් ඔබ ගැන කෙසේද? ඔබ අද රාත්‍රියේ මියගියහොත් ඔබ ස්වගර්යට යන්නේද?”

2. “තව කෙනෙක් ස්වගර්යට යන්නේ කොහොමද?”

3. “ඔබ ස්වගර්යට යන බව ඔබට දැනගත හැකි බව බයිබලය පවසන ආකාරය මම ඔබට කියන්නද? ”

පිළිතුර ‘ඔව්’නම් ඔවුන්ට 1,2,3 හඳුන්වා දෙන්න

1. පිළිගන්න මම වැරදි කළෙමි. මාගේ පාපය ශුද්ධ වූ දෙවියන් වහන්සේගෙන් මා වෙන් කරයි. (රෝම 3:23)

2. විශ්වාස කරන්න යේසුස් ක්‍රිස්තුස් මට සමාව දීමට මිය ගිය බවත්, පසුව නැවත නැඟිටුණ බවත් උන්වහන්සේ සැබෑ වූ දෙවියන් වහන්සේ බවත්ය. (රෝම 10:9-10)

3. පාපෝච්චාරණය මම පව් කළෙමි; මාගේ පාපයෙන් මිදී මාගේ ගැළවුම්කාරයා වීමට මට උපකාර කරන ලෙස යේසුස් වහන්සේගෙන් ඉල්ලන්න. (1 යොහාන් 1:9)

ඔවුන්ට 1,2,3 ප්‍රශ්න තේරුණා නම් මෙම ප්‍රධාන ප්‍රශ්න අසන්න:

"අද ඔබේ ජීවිතය සම්පූර්ණයෙන්ම යේසුස් ක්‍රිස්තුස්ට භාර දීමෙන් ඔබව වළක්වන්නේ කුමක්ද?"

ඔවුන්ව නවත්වන්නේ නැති නම්,

"දෙවියන් වහන්සේගේ උපකාරයෙන්, බයිබලයේ 'පාපය' ලෙස හඳුන්වන දෙයින් ඉවත් වී දිනපතා යේසුස් වහන්සේව අනුගමනය කිරීමට ඔබ කැමතිද?" යනුවෙන් අසන්න?"

විනාඩියක්
තුල
සාක්ෂි දැරීම

# ඔබේ කථාව
# අවසානයේ...

ඔවුන් ඔව් කියුවිට "ගැලවීමේ කවියත්" 1,2,3 ප්‍රශ්නත් නැවත කියන්න.

25 වනපිටුව බලන්න.

අවසන් වූ පසු, ඔවුන්ට සුබ පතන්න, පැහැදිලි කල කරුණු 3 දෙසට අවධානය යොමු කරන්න: දිනපතා බයිබලය කියවීම, දිනපතා යාච්ඤා කිරීම සහ සතිපතා පැ මිණීමට බයිබලය විශ්වාස කරන පල්ලියක් සොයා ගැනීම. ඊමේල් සහ දුරකථන අංක හුවමාරු කර, ඔවුන්ට සුබ පැතීම සදහා පැය 24ක් ඇතුළත නැවත ඔවුන් අමතන්න.

විනාඩියක්
තුල
සාක්ෂි දැරීම

ඔබ ඔවුන්ව ඇමතූ විට, ඔවුන්ට යො හන් 3:16-17 කියවීමට ඔහුගෙන් ඉල්ලා සිටින්න. ඉන්පසු ඔවුන්ට එයින් අදහස් කරන්නේ කුමක්දැ යි ඔවුන්ගෙන් අසන්න. ඔබ ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන්නේ කෙසේදැ යි ඔවුන්ගෙන් විමසන්න, ඔබ සමඟ පල්ලියට හෝ ඔබේ කුඩා කණ්ඩායමට යාමට ඔවුන්ට ආරාධනා කරන්න.

ඔවුන්ට ලබා දීම සඳහා අපගේ
පසු විපරම් වෙබ් අඩවිය මෙන්න:

frostygrapes.com

ස්වාමිනි, මම අද සූදානම්.
මගේ කථාව කියන පිණිස මට
අවස්ථාවක් ලබාදෙන්න. ආමෙන්.

විනාඩියක්
තුල
සාක්ෂි දැරීම

# THE SALVATION POEM

Jesus, You died upon a cross
And rose again to save the lost
Forgive me now of all my sin
Come be my Savior, Lord, and Friend
Change my life and make it new
And help me, Lord, to live for You

වෙබ් අඩවියේ ඇති ගීතය
ONEMINUTEWITNESS.ORG

ගැලවිමේ ගීතය. ලියා ඇත්තේ
මැට් සහ ෂෙරි මැක්ෆසර්න් 2004
ගැලවිමේ පදනම හට
සියළුම හිමිකම් ඇත.
WWW.THESALVATIONPOEM.COM

විනාඩියක් තුල සාක්ෂි දැරීම

# පුහුණුකරුවන් සඳහා ක්‍රමවේදයන්

1. මතෙව් 9:36 හි ඇති
   අනුකම්පාව හඳුන්වා දෙන්න
2. ඇඟිලි 5 මතක තබා ගැනීමට
   විනාඩියක් දෙන්න
3. විනාඩියක් තුල සාක්ෂි දැරීම,
   එක් වේලාවක් තුල එක් ඇඟිල්ලකි:
   - නියමිත ඇඟිල්ල සඳහා
     පොතේ නිසි පිටුව කියවන්න.
   - ඔබගේ පුද්ගලික සාක්ෂිය
     ඇඟිල්ලට අනුව බෙදාගන්න.
   - ඔවුන්ගේ ප්‍රතිචාරය සඳහා නිහඬව සිතන්නට
     කාලය දෙන්න.
   - ලියපු කියවන්න තුන්දෙනෙක්ට අවස්ථාව දෙන්න.
   - තමන්ගේ සහකරු සමග පුහුණුවන්න.
4. ඔබේ සම්පූර්ණ කතාව බෙදාගන්න — මිනිත්තුවේ සාක්ෂිය
   සම්පූර්ණ කරන්න.
5. සහකරුබෙදාගැනීම — තමන්ගේ මුළු කථාව
   සහකරු සමගබෙදා ගන්න කියන්න.
6. මාරු කරන්න
   තවත් අළුත් සහකරුවෙක් සමග පුහුණුවෙන්න.
7. ඉදිරියට රැගෙන යන්න
   20-21 කියවන්න.

8. අයදුම්කරුවන් පුහුණුකරන්න — ප්‍රශ්න 3ක් අසන්න :
   a. කීදෙනෙක්ට විනාඩියක සාක්ෂිදැරීම තේරුණාද?
   b. සැසිවාරයන් පිටත මේ මෙවලම කීදෙනෙක්ට පාවිච්චි කල හැකිද?
   c. අපි මෙය ආරම්භ කල යුත්තේ - ලබන වසරේ? ලබන මාසේ? කවදාද?

9. අයදුම්කරුවන්ට උපදෙස්

   අපි සියළුමදෙනා දැන් පිටතට යමු...
   a. එක්කෙනෙක් අඩුම 4දෙනෙක්ට වත් කථා කල යුතුය.
   b. පවසන වේලාවේදි පැමිණෙන්න. පොදු ස්ථානය අනුව අපි විනාඩි 60-75 ක් යෝජනා කරයි.

10. පැමිණි පසු

    3ක්ට අවස්ථාව දෙන්න ඔවුන්ගේ ප්‍රියතම කථාව බෙදාගන්නට.

11. දින 21 අභියෝගය — කැපවෙන්නේ කවුදැයි අසන්න ඔවුන්ගේ හවුල්කරු සමග දින 21 බෙදාගන්න පොත පිටුපස ඇති තානාපති ගිවිසුම් QR කෝඩය ස්කෑන් කරන්න.

12. ඊලඟ පියවර — ඊලඟ පුහුණුවීම සඳහා මිත්‍රයෙක් රැගෙන එන්නට ආරාධනා කරන්න.

විනාඩියක් තුල
සාක්ෂි දැරීම
Easy Faith-Sharing

තම ඇදහිල්ල නව තලයකට ගෙන යාමට බැරෑරුම් ලෙස සිතන අය සමඟ එක්වන්න. ඔබේ කතාව මාගර්ගතව ලියා අදම බෙදා ගන්න.

ONEMINUTEWITNESS.ORG

ගිවිසුම් සහගත තානාපතිකෙනෙක් වන්න, අපගේ බ්ලොග් සහ සම්බන්ධ වි දේවල් සොයාගන්න, නොමිලේ ත්‍යාගයන් සදහා OASISGIFTS.ORG වෙත පිවිසෙන්න

*ඔබගේ සාක්ෂිදැරිම පෙළඹවීම සදහා පොත්, සංගීතයන් සහ මෙවලම් ඇත!*

Oasis
WORLD MINISTRIES

PO BOX 58
CHAMPLIN, MN
55316 USA

පොත ඇණවුම් කිරිමට අපගේ වෙබ් අඩවිය වන වෙත පිවිසෙන්න:
oasisworldministries.org හෝ
විද්‍යුත් තැපැල: info@oasiswm.org

© 2009, සංශෝධිත 2025, ඕසිස් ලෝක අමාත්‍යාංශය ටොම් ඉලයි සහ ඕසිස් වලර්ඩ් සේවය විසින් ලියන ලද්දකි. සියලුම හිමිකම් ඇවිරිණි. ඕසිස් වලර්ඩ් සේවය වෙතින් ලිඛිත අවසරයකින් තොරව මෙම පොත් පිංවෙහි කිසිදු කොටසක් කිසිදු ආකාරයකින් වෙනස් කිරීම හෝ කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම කළ නොහැක.

Version 19.6UDT SINHALA.